3 වන පිටුවෙන් (කොටි සුද්ද කිරීම)

නුවර දී විශාල මුදලක් එකතු කර ගැනීමට ද සමත් වූ බව පැවසීය.

කොටි නායකයා විමුක්තිකාමිකයකු ලෙසින් දකින්නට ද ඔහු සූදානම් නැත. ප්‍රභාකරන්ට වුවමනා අන් කිසිවකටත් වඩා තම බලය තහවුරු කරගන්නට යයි කී මේ පුද්ගලයා තවත් වැදගත් කරුණක් අවධාරණය කළේ ය. ප්‍රභාකරන් කිසිදා සාමයක් අපේක්ෂා නොකරන බව කී ඔහු එයට හේතුව ද දැක්වී ය. සාමය ඇති වුවහොත් තමා ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට පැමිණවීම අනිවාර්ය බව ප්‍රභාකරන් දන්නේ ය. මෙයත් මා අන් කිසිවකුගෙන් අසා නැත. මෙල්බර්න් හි එක්තරා උපනගරයක වාසය කරන කොටි අනුගාමිකයකු විශාල වශයෙන් ආධාර එකතු කරන බව ද ඔහු සඳහන් කළේ ය. එම උපනගරයෙන් සිරභාරයට ගන්නා ලද කොටි ආධාරකරුවා ඔහු කී පුද්ගලයා වන්නට ඇතැයි පසුව මට කල්පනා විය. යුදමය දිනුමකින් කොටි බලය සහ සටන් අවසන් නොවන බව කියන මහාචාර්ය සිසිර ජයසූරිය තවත් එඩිතර ප්‍රකාශයක් කර ඇත. මේ රටේ මෙන් බහු සංස්කෘතික සමාජයක දෙමළ ජනතාව ජීවත් විය යුතු බවක් කිසිම සිංහලයන් බහුල රජයකින් නොපිළිගැනුණු බව ය, ඒ. එසේ කියන එතුමාට අමතක වූ කරුණක් මෙල්බර්න් නිදහස් දින උළෙලේදී ශ්‍රී ලංකා මහ කොමසාරිස් විසින් පෙන්වා දෙනු ලැබී ය. ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගෙන් බහුතරයක් ඊනියා දෙමළ නිජබිම වශයෙන් සැළකෙන උතුරු නැගෙනහිර පළාත් වලින් පිටත සිංහල අඩවියේ වාසය කරන බව ය, ඒ. ඔහු නොකී තවත් වැදගත් කරුණක් ඇත. එනම් ශ්‍රී ලංකාවේ දෙමළ ජනයාට රටේ කවර පෙදෙසක වුවත් ජීවත් වීමට ඉඩ ඇති නමුත්, උතුර සපුරා සුද්ද කළ කොටි සිංහල, මුස්ලිම් දෙවර්ගයම ඒ පෙදෙසෙන් පලවා හරින ලද බව ය, ඒ.

ඒ අනුව කල්පනා කරන විට, සැබැවින්ම බහු ජාතික - බහු සංස්කෘතික කලාපයක් වශයෙන් ගත හැක්කේ සිංහලයන් වාසය කරන කොටස් පමණකි. මේ කරුණ සිසිර ජයසූරියට පමණක් නොව මේ ර ටේ වාර්තාකරුවන්ටත්, පොදු ජනතාවටත් යළි යළිත් මසක් කර දිය යුතු බව පෙනෙයි.

මහාචාර්යවරයා අර්ථ ශාස්ත්‍රය අදහන්නකු බව නොකිව මනා ය. එහෙත් ඔහු ආර්ථික සාධකය පමණ ඉක්මවා අවධාරණය කරන බව නම් පෙනෙයි. ඔහු කියන විදියට, රජය යුදමය දිනුමක් සොයන්නේ ආර්ථික අර්බුදය වසන් කිරීම සඳහා ය. ජේ.ආර්.ජයවර්ධන උතුමාණන් වහන්සේගේ පටන් ඔහුගේ බෑනා වූ රනිල් වික්‍රමසිංහ දක්වා පාලකයන් අත ගගා සිටි ජාතික කාරියක් තවත් කල් පසු නොකර විසඳීමේ අවශ්‍යතාව වටහා ගැනීමට තරම් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා දූරදර්ශී වූ බව කියන්නට ඔහු කැමති නැත. ජාත්‍යන්තර සංවිධාන වලින් කොටින්ගේ අසත්‍ය ප්‍රචාර තහවුරු කිරීමට දරන ලද ප්‍රයත්න දැන් හෙළි වී ඇතැයි සිතමි. මිය ගිය සිවිල් වැසියන් 300ක ප්‍රශ්නයක් ජයසූරියගෙන් අසන ඒ.බී.සී. නියෝජිතයා ද ජයසූරිය පරිදිම රජයේ ප්‍රකාශය නොපිළිගන්නා බව පෙනෙයි. සමහර විට ජයසූරිය මෙන්ම මේ රටේ සමහර වාර්තාකරුවන් ද, කොටු කරගෙන සිටින සිවිල් ජනතාව මුදා හරින්නැයි කොටින්ට බල කරනු වස් උද්ඝෝෂණය කරන වව්නියාවේ දෙමළ ජනයා නොදකින - ඔවුන්ගේ හඬ නොඇසෙන තැනට වැටී ඇතැයි ද සිතමි.

කොටි සාමාජිකයන් අන්තිමට තැනින් තැන ත්‍රස්ත ක්‍රියාවන්හි නිරත වීමට ඉඩ ඇති නිසා ප්‍රශ්නය කෙළවරක් නොවන බව කියන මහාචාර්යවරයා අමතක කරන තවත් කරුණක් ඇත. ශ්‍රී ලංකාවේ කවර පළාතක වුව ද නිදැල්ලේ හැසිරෙන දෙමළ ජනයා අතර වසන් වී සිය ත්‍රස්ත ක්‍රියා කරන්නට කොටි සාමාජිකයන්ට ඉඩ ඇති බව ය, ඒ.



# සමන් මහානාම දිසානායක ගේ ලන්සි කෙල්ල නවකතාව

සිඩ්නි නුවර අප අතරම වෙසෙන පරිනත නවකතාකරුවෙකු වන සමන් මහානාම දිසානායක ගේ අළුත්ම නවකතාව ලන්සි කෙල්ල නමින් දැන් අප අතරට පැමිණ තිබේ. මේ සමන් දිසානායක ලියූ හය වන නවකතාවයි. ඔහු ලියූ අනෙක් නවකතා නම්, බඹරුන්දේ කඟවේනා, කැන්ගරු නිම්නය, පුංචි සර්, රන්දෙනිගල වලව්ව සහ දුරුතු සිහිනය නම් විය.

සමන් දිසානායක ගේ නවකතාවලට කවදත් අනුභූතිය වන්නේ සැප, දුක, ලාබ, අලාභ, අයස, යස, නින්ද සහ ප්‍රසංශා යන අෂ්ඨ ලෝක ධර්මතාවයන් ට මුහුණ දෙමින් ජීවන ගමන ගෙවන පුහුදුන් මිනිසුන් පිළිබඳව වූ අපූරු කතාවස්තූන් ය. නවකතා කරුවෙකු වශයෙන් සමන් උපයෝගී කරගන්නා ආකෘතිය ද පාඨකයා වෙහෙසට පත් කරවන්නක් නොවේ. අති සංකීර්ණ කතා පුවතක් වුවද සරල ලෙස ද, විස්තරාත්මකව ද, ඉදිරිපත් කිරීමට සමන් දක්ෂයෙකි.

ලන්සි කෙල්ල නවකතාව ද මේ සියළු ගුණාංගයන්ගෙන් සමන්විත, එක හුස්මට, ආශාවෙන් කියවන්නට හැකි කෘතියක් ලෙස හඳුන්වා දීමට මම කැමැත්තෙමි.

ලන්සි කෙල්ල නවකතාව ප්‍රධාන වශයෙන් ගෙතී ඇත්තේ වැරදි ලෙස ජීවිතය ගෙනයන දෙමව්පියන් නිසා ජීවිතය අඳුරු කරගන්නා දියණියක්, සෙල්ලක්කාර තරුණයෙක් සහ දෙමව්පියන් ගේ ආදරය, කරුණාව නොලැබ දුක සේ හැදෙන වැඩෙන ඔවුන් ගේ අවජාතක දරුවන් දෙදෙනෙක් වටාය. මේ නවකතාව කියවීමේ දී මට නිරතුරු සිහිවුයේ ධම්මපදයයි. මිනිසුන් වශයෙන් අප කරනා පාප කර්ම අප පිටුපස රිය සක සේ කැරකෙන බව එහි කියවේ. ලන්සි කෙල්ල මේ සනාතන ලෝ දහම මනා ලෙස ඔප් නංවන කතාවකි. මෙහි එන නිල්මිණි, රංජි, මහේෂ් සහ නාමල් යන ප්‍රධාන චරිත තමන් අතීතයේ සිදු කළ අවිචාර ක්‍රියාවන්ගේ අනිවාර්ය ප්‍රථිඵලයන් ගෙන් බේරීමට අඩු වැඩි වශයෙන් වැර දැරුවද අවසානයේ එයින් දුකට පත් වෙති. එසේ වෙතත් ලන්සි කෙල්ල නවකතාව ශෝකාන්තයක් නොවේ. මඩ ගොහොරුවක උපන් සියපතක් මෙන් මෙහි එන නයනා ගේ චරිතය සිය අඳුරු අතීතය බැහැර කර පිපී සුදිලේ. ජිනදාස ගේ චරිතය ද එසේමය.

ලන්සි කෙල්ල අනුසාරයෙන් අපූරු සිනමා සිත්තමක් මැවිය හැකිවෙනු ඇත.

සමන් දිසානායක ගේ ලන්සි කෙල්ල නවකතාව කියවීමේ දී මට ඇතිවුනු එක් ප්‍රශ්ණයක් නම් සමස්තයක් වශයෙන් මෙහි කතාවට ලන්සි කෙල්ල යන නමේ ඇති ගැලපීම අඩුවීමයි. ඇතැම් අතීතාවර්ජනා තරමක් සක්ෂිප්ත කිරීමට ඉඩකඩ ඇති බව පෙනුණු අතර, දෙබස් තුල දෙබස් භාවිතය කතාවේ ගලායාමට තරමක බාධාවක් ලෙස හැඟුණි. මෙහි එන ඇතැම් සෘංගාරාත්මක ජවනිකා මා සිත් ගත් බව ද කිව යුතුය. ජිනදාස ගයන විරිදු පදවැල් මගේ අතීතකාමය ඇවිස්සීය.

අවසාන වශයෙන් පැවසිය යුත්තේ, සරල පෙම්කතා ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වී ඇති යුගයක, සිංහල පාඨක රස වින්දනය එයින් ඉහල මට්ටමකට නංවන තවත් සාර්ථක කෘතියක් ලෙස මා ලන්සි කෙල්ල නවකතාව දකින බවයි.

**රසික සූරියආරච්චි**

